1. විශේෂඥ පද්ධතියක් සමන්විත වන සංඝටක තුනක් හඳුන්වන්න.

2. වෛද්‍ය උපදෙස් ලබා දෙන මාර්ගගත සේවාවක නිරත වන ශිල්පියෙක් වෛද්‍ය උපදෙස් ලබා දීම සඳහා න්‍යාය,නීති රීති සහ සම්භාවිතා මත පදනම් ව උපදෙස් ලබා දෙන පද්ධතියක් යොදා ගැනීම සඳහා හේතු දෙකක් සඳහන් කරන්න.

3. විශාල හෝටල් සමාගමක් නිවාඩු නිකේතන මධ්‍යස්ථානයක නව හෝටලයක් ඇරඹීමට අදහස් කරයි.එහි කාමර වෙන් කිරීම සහ ඇණවුම් කිරීම (Room Reservations and bookings) සඳහා නව තොරතුරු පද්ධතියක් අවශ්‍ය වේ.මේ සඳහා මාර්ගගත විමසුම් පද්ධතියක් අවශ්‍ය වේ.එමගින් කාමර වෙන්කිරීම,ඇණවුම් කිරීම සහ ගෙවීම් කටයුතු ද සිදු කළ හැකි විය යුතුය.

   a) ඉහත කාර්යය සඳහා දත්ත ආදාන තිරයක් සැලසුම් කිරීම ඔබට පැවරී ඇත.එමගින් පිළිගැනීමේ නිළධාරිනියට කාමර වෙන් කිරීම සහ ඇණවුම් කිරීම පිළිබඳ දත්ත ආදානය කිරීමට හැකිවිය යුතුය.එම ආදාන තිරය ඇඳ කොටස් පැහැදිලිව නම් කරන්න.
   b) පරිශීලක මිතුරු අතුරු මුහුණතක් සැලසුම් කිරීමට ඔබ යොදා ගන්නා දත්ත සප්‍රමාණතා (validation techniques)ක්‍රම තුනක් නම් කරන්න.